295

RARE

# ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයෙහි සේවා නියුක්තිකයින්ගේ සෞඛ්‍ය සංරක්ෂණය පිළිබඳ අධ්‍යයනයක්

(තෝරාගත් කර්මාන්ත ශාලා 3 ක් ඇසුරින් - ලලාන් රබර් පුද්ගලික සමාගම, මාපා ලලාන් පුද්ගලික සමාගම සහ ලංකා ලෝහ හාඩ්වෙයාර් ලිමිටඩ්)

ලොකු නිශ්ශංක ආරච්චිලාගේ ඉන්ද්‍රාණි

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ආර්ථික විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.

2000 අගෝස්තු

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 295 |
| වර්ග අංකය | |

# සාරාංශය

ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ප්‍රතිපත්තිය තරඟකාරී වෙළඳ පොළ ආර්ථිකයක් මූලික කොට ගත්තක් වශයෙන් හැඳින්විය හැකිය. 1977 දී අපනයනය ප්‍රමුඛ කාර්මිකරණ ප්‍රතිපත්තියක් සමඟ වෙළඳාම ලිබරල්කරණය හඳුන්වා දෙන ලදී. අද ලෝකය පුරාම ඇති පොදු එකඟතාව මෙන්ම පුළුල් වශයෙන් ඔප්පු වී ඇති පොදු අත්දැකීමද වන්නේ පෞද්ගලික අංශය හා සසඳන කළ රාජ්‍ය අංශය සැලකිය යුතු තරම් කාර්යක්ෂමතාවයකින් යුක්ත නොවන බවයි. මේ අනුව වර්තමාන කාර්මිකරණ ප්‍රතිපත්තිය තුළ පෞද්ගලික ව්‍යවසායට වැදගත් තැනක් හිමිවී ඇත. පෞද්ගලික ව්‍යවසායට අයත් නිෂ්පාදන කර්මාන්ත, ආර්ථික වර්ධනයෙහි ද, රැකියා සැපයීමෙහි ද, ආදායම් ඉපයීමෙහිද වැඩි දායකත්වයක් දරන බවද පැහැදිලි වන කරුණකි.

නිෂ්පාදන කර්මාන්ත කෙෂ්ත්‍රයෙහි ශ්‍රම හමුදාවෙන් වැඩි පිරිසක් සේවා නියුක්තව සිටින අතර, මෙම අධ්‍යයනයේ ගැටළුව වූයේ එම කෙෂ්ත්‍රයෙහි සෞඛ්‍ය සංරක්ෂණය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳව විමර්ශනය කිරීමයි.

මේ පිළිබඳව කරුණු විශ්ලේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පෞද්ගලික ව්‍යවසායට අයත් නිෂ්පාදන කර්මාන්ත ශාලා 3 ක් අධ්‍යයනයට භාජනය කළ අතර දත්ත එක් රැස් කර ගැනීම සඳහා විශේෂයෙන් සහභාගී නිරීක්ෂණය තුළින් ලැබූ අත්දැකීම් සහ සම්මුඛ සාකච්ඡා මගින් අදාල නිලධාරීන්ගෙන්, සේවක මණ්ඩලයෙන් සහ ඔවුන්ගේ නිවෙස්වලින් ලබාගත් තොරතුරු යොදා ගැනීමට සිදුවිය.


පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.


නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රයෙන් සිදු කළ මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වූ සාධකයක් වූයේ නිෂ්පාදන කර්මාන්ත කෙෂ්ත්‍රයෙහි සෞඛ්‍ය සංරක්ෂණය කෙරෙහි ඇති කරන බලපෑම යහපත් තත්ත්වයක නොපවතින්නේය යන්නයි. නිෂ්පාදකයන් තම ලාභය කවර ආකාරයකින් හෝ උපරිම කිරීමට උත්සාහ ගන්නා අතර මෙහිදී මානසික හා සදාචාරාත්මක ලෙස කටයුතු නොකිරීම පැහැදිලි වම හඳුනාගත හැකි විය.

මේ හේතුවෙන් නිෂ්පාදන කර්මාන්ත තුළ ශ්‍රමිකයින් කායික, මානසික හා සමාජීය ගැටළු රාශියකට මැදිවන ආකාරයත්, එම තත්ත්වය සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට බාධාවක් වන අන්දමත්, ශ්‍රමිකයින් මුහුණ දෙන සෞඛ්‍යමය ගැටළු අවම කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයන් පිළිබඳවත් විස්තරාත්මකව කරුණු මෙහි අන්තර් ගත කොට ඇත.